# ලාදුරු පුවත් වාර්තාව- 2015 වර්ෂය

## ප්‍රදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - කොළඹ

**ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකතුමාගේ පණිවිඩය**

කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ලෙස මා හට 2015 ලාදුරු පුවත් වාර්තාව සඳහා පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම ඉතා අගය කරමි. ලාදුරු ශ්‍රී ලංකාවෙන් මුළුමනින්ම තුරන් වී ඇති රෝගයක් ලෙස පොදු ජනතාව අතර ප්‍රකට වී ඇත. නමුත් දිවයින පුරා වසරකට නව ලාදුරු රෝගීන් විශාල සංඛ්‍යාවක් වාර්තා වන අතර, එයින් වැඩිම රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වන්නේ කොළඹ දිස්ත්‍රික්කයෙනි. එබැවින් ලාදුරු මර්දන වැඩසටහන් සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ ඉහල ප්‍රමුඛතාවයක් ලබා දිය යුතුය. කොළඹ දිස්ත්‍රික්කයේ ලාදුරු රෝගය තුරන් කිරීම සඳහා 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා ෆෙයාමෙඩ් පදනමේ අනුග්‍රහයෙන් සාර්ථක වැඩ පිළිවෙලක් දියත් කරන ලදී. ඒ පිලිබඳ තොරතුරු ඇතුලත් මෙම පුවත් වාර්තාව 2016 වර්ෂයේදීත් සාර්ථක වැඩ පිළිවෙලක් දියත් කිරීමට ඉවහල් වේ යයි මම විශ්වාස කරමි.



**ප්‍රාදේශීය වසංගත රෝග වේදාඥතුමියගේ පණිවිඩය**

ශ්‍රී ලංකාවේ වසරකට වැඩිම ලාදුරු රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වන කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය වසංගත රෝග වේදාඥ ලෙස කටයුතු කරන මා මෙම පත්‍රිකාව සඳහා පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳව සතුටු වෙමි. ශ්‍රී ලංකාවේ ඉතා අප්‍රකටව එහෙත් වසංගත රෝගයක් ලෙස ව්‍යාප්තව පවතින ලාදුරු රෝගය මර්ධනය සඳහා 2015 වර්ෂයේ සතුටුදායක සහ සාර්ථක වැඩ පිළිවෙලක් දියත් කල අතර එමගින් වාර්තාගත රෝගීන් සංඛ්‍යාව 2014 වර්ෂයට වඩා 2015 වර්ෂයේදී 59න් අඩු කර ගැනීමට හැකි වී ඇත. මෙයාකාරයෙන් සාර්ථක වැඩ පිළිවෙලක් 2016 වර්ෂයේදීත් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර එමගින් ඉදිරි රෝග නිවාරණ කටයුතු සාර්ථක කර ගැනීමටත් ලාදුරු රෝගය කොළඹ ප්‍රාදේශීකයෙන් තුරන් කිරීමට හෝ අවම මට්ටමකට ගෙන ඒමට පිටුවහලක් ලැබේ යයි මම විශ්වාස කරමි.

කොළඹ ප්‍රදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය කොළඹ දිස්ත්‍රික්කයෙන් වර්ග කිලෝ මීටර 625 ක ප්‍රමාණයක් ආවරණය කරන අතර මිලියන 1.8 ක ජනගහනයක් සඳහා සෞඛ්‍ය සේවාව සපයනු ලබයි. පරිපාලනමය වශයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 15 කින් සමන්විත වන අතර රෝග නිවාරණය පිලිබඳ වගකීම ප්‍රධාන වශයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් දරනු ලබන අතර ඒ සඳහා මහජන සෞඛ්‍ය නිලධාරීන් විසින් ක්ෂේත්‍ර ක්‍රියකරකම් සිදු කිරීම කරනු ලබයි. කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාශය තුල එක් දිස්ත්‍රික් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීවරයෙක්, පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු හය දෙනෙක් හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු හැත්තෑ පස් දෙනෙක් බෝ වන රෝග මර්දනය හා නිවාරණය උදෙසා කටයුතු කරයි. එමෙන්ම මහජන සෞඛ්‍ය හෙද නිලධාරීන් හා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ද සෞඛ්‍ය සේවාවන් සපයනු ලබයි.

අධික ජනගහනයක් සහිත දිස්ත්‍රික්කයක් වන කොළඹ දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය සේවාවන් සපයන ආයතන වශයෙන් රෝහල් පහළොවක්, ශික්ෂණ රෝහල් දෙකක්, මූලික රෝහල් හතරක් හා ප්‍රදේශීය රෝහල් නවයක් ක්‍රියාත්මක වේ. එසේම චර්ම රෝග සේවාව ලබා ගැනීම සඳහා චර්ම රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන් සය දෙනෙක් ශ්‍රී ජයවර්ධනපුර ශික්ෂණ රෝහල, දකුණු කොළඹ ශික්ෂණ රෝහල, මූලික රෝහල නැගෙනහිර කොළඹ, මූලික රෝහල හෝමාගම හා මූලික රෝහල අවිස්සාවේල්ල යන රෝහල්වල සේවා සපයනු ලබයි.

ලාදුරු තවමත් කොළඹ දිස්ත්‍රික්කය තුල සෞඛ්‍ය ගැටලුවක් ලෙස පවතින අතර 2015 වර්ෂය අවසාන වන විට නව ලාදුරු රෝගීන් 245 ක් (ජනවාරි මස අග දත්ත ලේඛනයට වාර්තා වූ පරිදි ) හඳුනා ගෙන ඇත. සමස්ත නව ලාදුරු රෝගීන්ගෙන් 86.93% ක් (රෝගීන් 213ක් ) දකුණු කොළඹ ශික්ෂණ රෝහල, ශ්‍රී ලංකා ජාතික රෝහල, මධ්‍යම ලාදුරු සායනය හා මූලික රෝහල පානදුර යන රෝහල් වලින් වාර්තා වී ඇත.

## 2014 සහ 2015 වර්ෂ සඳහා ලාදුරු රෝගය පිලිබඳ විශ්ලේෂණාත්මක දත්ත වාර්තාව

| | 2014 | 2015 | වෙනස % |
|---|---|---|---|
| අලුතින් හඳුනා ගත් රෝගීන් (New Patients) | 304 | 245 | -19.4 |
| ළමා රෝගීන් (<15) (Children <15 years) | 46 | 32 | -30.4 |
| ශ්‍රේණි අංක 2 ආබාධිතතා සහිත රෝගීන් (Grade 2 deformity) | 18 | 18 | 0 |
| බහු ජීවාණු රෝගීන් (Multi bacillary) | 130 | 136 | 4.62 |
| කාන්තා රෝගීන් (Females cases) | 131 | 105 | -19.8 |
| රෝගය ඇතිවී මාස 6ක් යාමට පෙර හඳුනාගත් රෝගීන් සංඛ්‍යාව (Onset of symptoms < 6 month) | 124 | 103 | -16.9 |
| අවුරුදු 55ට වැඩි වයස් කාණ්ඩයේ රෝගීන් සංඛ්‍යාව (Age group >55) | 66 | 54 | -18.1 |
| නිවේදනය කරන ලද රෝගීන් සංඛ්‍යාව (No of patients notified) | 169 | 166 | -1.77 |
| රෝගය සුව වී නැවත වැළඳුනු රෝගීන් සංඛ්‍යාව (No of relapse cases) | 17 | 08 | -52.9 |
| නැවත ප්‍රතිකාර ආරම්භ කල රෝගීන් සංඛ්‍යාව (No of defaulters restarted treatment) | 13 | 12 | 7.6 |

2014 සහ 2015 වර්ෂ සඳහා ලාදුරු රෝගය පිලිබඳ විශ්ලේෂණාත්මක දත්ත වාර්තාව අනුව 2015 වර්ෂයේ නව රෝගීන් වාර්තා වීම 19.4 % න් අඩුවී ඇත. 2015 වර්ෂයේ නව ලාදුරු රෝගීන් 245ක් වාර්තා වූ අතර 136ක් බහු ජීවාණු රෝගීන් වේ. මෙයින් ළමා රෝගීන් 32ක් ද, ශ්‍රේණි අංක 2 ආබාධිතතා සහිත රෝගීන් 18ක් ද, කාන්තා රෝගීන් 105ක් සහ රෝගය සුව වී නැවත වැළඳුනු රෝගීන් 8ක් (Relapse) වාර්තා වී ඇත.

### ලාදුරු ස්ථානීය සිතියම - 2015




ලාදුරු ස්ථානීය සිතියම මගින් කොළඹ ප්‍රදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල ප්‍රදේශය තුල ලාදුරු රෝගීන්ගේ වාර්තා වීමේ භූගෝලීයීය ව්‍යාප්තිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශ අනුව ඉදිරිපත් කර ඇත.

| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශය | ජනගහනය | අලුතින් හඳුනා ගත් රෝගීන් සංඛ්‍යාව | නිවේදනය කරන ලද රෝගීන් සංඛ්‍යාව | නව රෝග වාර්තාවීමේ අනුපාතය | ළමා රෝගීන් සංඛ්‍යාව | ළමා රෝග අනුපාතය | විකලාංගතා සහිත සංඛ්‍යාව | විකලාංගතා සහිත අනුපාතය ජනගහනයෙන් 100000 | ස්ත්‍රී රෝගීන් සංඛ්‍යාව | බෙහෙත් ගැනීම මාස 6ට වඩා ප්‍රමාද වූ සංඛ්‍යාව | නැවත වැළඳුනු රෝගීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බොරලැස්ගමුව | 83911 | 06 | 5 | 7.15 | - | 0 | - | 0 | 2 | 4 | - |
| දෙහිවල | 89651 | 12 | 10 | 13.38 | 2 | 16.66 | - | 0 | 3 | 8 | - |
| රත්මලාන | 97085 | 16 | 14 | 16.48 | 6 | 37.5 | 1 | 1.03 | 4 | 6 | 1 |
| හෝමාගම | 129046 | 12 | 7 | 9.29 | - | 0 | - | 0 | 5 | 4 | 1 |
| කඩුවෙල | 173693 | 13 | 13 | 7.48 | - | 0 | - | 0 | 8 | 7 | - |
| බත්තරමුල්ල | 83911 | 04 | 2 | 4.76 | 1 | 25 | - | 0 | 3 | 4 | 1 |
| කොලොන්නාව | 195042 | 36 | 18 | 18.45 | 2 | 5.55 | 5 | 2.56 | 14 | 14 | - |
| පිටකෝට්ටේ | 65936 | 05 | 4 | 7.58 | - | 0 | - | 0 | 3 | 2 | - |
| මහරගම | 156164 | 06 | 9 | 3.84 | 1 | 16.66 | 1 | 0.64 | 3 | 4 | - |
| නුගේගොඩ | 86897 | 17 | 11 | 19.56 | 3 | 17.64 | 2 | 0 | 9 | 4 | - |
| පිළියන්දල | 188384 | 22 | 18 | 11.67 | 2 | 9.09 | - | 0 | 9 | 8 | 1 |
| මොරටුව | 170906 | 89 | 47 | 52.07 | 15 | 16.85 | 6 | 0 | 42 | 35 | 4 |
| හංවැල්ල | 115975 | 05 | 3 | 4.31 | - | 4.31 | 1 | 0.86 | 2 | 1 | - |
| පාදුක්ක | 66557 | 00 | 0 | 0 | - | 0 | - | 0 | - | - | - |
| කහතුඩුව | 112312 | 02 | 3 | 1.78 | - | 1.78 | - | 0 | 1 | 2 | - |

මෙම වගුවට අනුව ලාදුරු නව රෝගීන්ගෙන් අඩකට වැඩි ප්‍රමාණයක් (51% : රෝගීන් 125 ක්) වාර්තා වී ඇත්තේ ලාදුරු පිළිබඳ ඉහල අවදානමක් සහිත මොරටුව (36%) හා කොළොන්නාව (14%) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශ වලිනි. එමෙන්ම ලාදුරු ළමා රෝගීන් ගැන අවධානය යොමු කිරීමේදී මොරටුව හා දෙහිවල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශ පිළිවෙලින් ළමා රෝගීන් 15 ක් හා 6 ක් වාර්තා කරයි. මෙය වාර්තා වූ සමස්ත ළමා රෝගීන්ගෙන් 65% ක නියෝජනයකි.

## 2015 වර්ෂය තුල ලාදුරු මර්දනය සඳහා ගත් ක්‍රියාමාර්ග

මෙම වර්ෂය තුල කොළඹ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, මධ්‍යම ලාදුරු සායනය හා ෆෙයාමෙඩ් පදනමේ සහයෝගය සහිතව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒවායින් සමහරක් ලෙස:

- වැඩි ළමා රෝගීන් සංඛ්‍යාවක් හඳුනා ගැනීම සඳහා ලාදුරු පිළිබඳ ඉහල අවදානමක් සහිත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශ වල ඇති පාසල් වල සමේ රෝග වැඩසටහන් 20 ක් (School Screening) පැවැත්වීම
- වැඩි රෝගීන් සංඛ්‍යාවක් හඳුනා ගැනීම සඳහා ලාදුරු පිළිබඳ ඉහල අවදානමක් සහිත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශ වන මොරටුව සහ කොලොන්නාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශ වල හඳුනා ගත් ග්‍රාමනිලධාරී ප්‍රදේශවල ලාදුරු රෝගය සඳහා නිවෙස් වලට ගොස් පරීක්ෂා කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- ලාදුරු සායනය සඳහා පැමිණෙන ආර්ථික අපහසුතා ඇති රෝගීන්හට නොකඩවා සායන වෙත පැමිණීම සඳහා අවශ්‍ය මාසික ගමන් ගාස්තුව ලබා දීම
- ලාදුරු රෝගීන්ට වඩා හොඳ සේවාවක් ලබාදීම සඳහා මොරටුව දිසා රෝහලේ ලාදුරු පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙහි මාසයකට දෙවතාවක් විශේෂ භෞත චිකිත්සක සායනයක් පැවැත්වීම
- ලාදුරු රෝගීන් සඳහා උවාරණ, තුවාල වලට බෙහෙත් දැමීම සඳහා අවශ්‍ය කරන උපකරණ කට්ටල සහ විශේෂ පාවහන් බෙදා දීම

**2015 වර්ෂය තුල ලාදුරු මර්දනය සඳහා ගත් ක්‍රියාමාර්ග (තවදුරටත්.......)**

- ආයුර්වේද වෛද්‍යවරු 120ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- ලෝක ලාදුරු දිනය නිමිත්තෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ 6ක, වෛද්‍ය නිලධාරීන් සහ ප්‍රජා නායකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- ඉන්දියාවේදී ලාදුරු පිලිබඳ පරිපූර්ණ පුහුණුවක් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් තිදෙනෙකුට ලබාදීම
- දිස්ත්‍රික්කයේ තෝරාගත් රෝහල් වල බාහිර රෝගී අංශයේ වෛද්‍යවරුන්ට හා සැරහුම් කාමරයේ හෙද නිලධාරීන් සඳහා ලාදුරු රෝගීන්ගේ තුවාල කලමනාකරණය කිරීම සම්බන්ධයෙන් විශේෂ පුහුණුවක් ලබාදීම
- දිස්ත්‍රික් ලාදුරු කණ්ඩායමෙහි සාමාජිකයන් සඳහා කිතුල්ගලදී කණ්ඩායම් කුසලතා වර්ධනය කිරීම පිලිබඳ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම
- මොරටුව දිසා රෝහලේ පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ පහසුකම් වැඩි දියුණු කිරීම
- අවිස්සාවේල්ල මූලික රෝහලේ සැරහුම් කාමරයේ පහසුකම් දියුණු කිරීම
- මොරටුව දිසා රෝහලේ ලාදුරු පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම
- ගර්භනී සායන වල මව්වරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- දිස්ත්‍රික් ලාදුරු මර්දන ඒකකය සඳහා අත්‍යවශ්‍ය උපකරණ ලබාදීම
- පරිවාර සායන (Satellite Clinics) සිදු කිරීමට අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම

ඒ අනුව, පුහුණු කරන ලද කාර්යය මණ්ඩලය හා වැඩි දියුණු කළ පහසුකම් සහිතව කොළඹ දිස්ත්‍රික් ලාදුරු මර්දන කණ්ඩායම, මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යයමණ්ඩලය සමඟ 2016 වර්ෂයේදීත් කොළඹ දිස්ත්‍රික්කයෙන් ලාදුරු රෝගය තුරන් කිරීම උදෙසා සාර්ථක වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.










